**ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 10 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 138.60 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 127.47 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.13 ක් හෙවත් සියයට 8.04 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 106.72 | 97.12 | 9.60 | 9.00 |
| මූලධන | 31.88 | 30.85 | 1.53 | 4.80 |
| එකතුව | 138.60 | 127.47 | 11.13 | 8.04 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.00 | 2.49 | 1.25 | 1.63 | 12.00 | 6.47 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0016/0094/000 දරන තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 17.42 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි.452(2) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1987 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාන්ඩාගාරික චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 9 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 67 දක්වා වන පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.313,769 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ සඳහා වර්ෂ 1 සිට වර්ෂ 25 දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

**(ආ)** 1994 අගෝස්තු මස 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදයට අනුව කේවල ශේෂ සඳහා උපලේඛන සකස් කිරීමේ දී අදාළ පරිදි දිනයන් සඳහන් කළ යුතු වුවත්, කේවල ශේෂ සඳහා උපලේඛන සකස් කිරීමේ දී නිලධාරීන් ස්ථාන මාරු වී යාම, සේවය

අතහැරයාම, වැඩ තහනම් කිරීම, විදේශ ගතවීම යනාදිය සඳහා අදාළ දිනයන් සඳහන් කර නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී ඇතත්, එය පුරප්පාඩුව පවතින අතර දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

### 3.4.2 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 06 දිනැති අංක ඩී.එම්.ඒ. 2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව කාර්තුවකට එක් වරක් බැගින් අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(i)** මුදල් රෙගුලාසි. 396 | 704,229 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 6 ක් ඉක්මවූ චෙක්පත් 68 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි. 447 (4), 447(9) | - | වැය ලෙජරයේ සටහන් තැබීමේදී නිසි ස්ථානවල එකතු වටිනාකම් ඇතුළත් කරමින්, එමගින් මූල්‍ය පාලනයක් සිදුකළ හැකි පරිදි පවත්වා ගෙන නොතිබුණි. |

**3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**රාමසාන් උපවාසය නිමිතිකොට සෞදි අරාබි රජයෙන් නොමිලේ ලද රටඉඳි නිදහස් කර ගැනීම හා බෙදා හැරීම**

---

රාමසන් උපවාසය නිමිතිකොටගෙන, මුස්ලිම් ප්‍රජාව වෙත බෙදා හැරීම සඳහා සෞදි අරාබි ජනරජයෙන් ශ්‍රී ලංකාව වෙත රටඉඳි මෙට්‍රික් ටොන් 222 ක් නොමිලේ ලබාදී තිබුණි. එම රටඉඳි තොගය රේගුවෙන් නිදහස් කර ගැනීමේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගාස්තු, නැව් සමාගම් ගාස්තු, රේගු ගාස්තු ගුදම් ගාස්තු නිෂ්කාෂණ සමාගමේ ගාස්තු සහ අනෙකුත් බදු වශයෙන් රු.20,477,913 ක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි. මෙම ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් රටඉඳි නිෂ්කාෂණය සම්බන්ධයෙන් පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි .

(ආ) අදාළ පෞද්ගලික සමාගම විසින් රටඉඳි තොගය නිෂ්කාෂණය සඳහා රු.16,229,833 ක දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර පසුව එය රු.19,089,707 ක් ලෙස ද රු.20,477,913 ක් ලෙස ද වරින්වර සංශෝධනය කර තිබුණි. ඒ අනුව මුල් දළ ඇස්තමේන්තුවට අනුව රු.4,248,080 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබූ රු3,000,00.ක් ද අතිරේක ප්‍රතිපාදන මගින් ලබාගත් රු 13,230,000.ක් ද මුස්ලිම් පූණ්‍ය අරමුදලින් රු 1,500,000.ක් ද යොදා ගෙන බිල්පත් ගෙවා තිබුණ ද තව දුරටත් මුදල් ගෙවිය යුතු වූ බැවින් නිෂ්කාෂන කටයුතු ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් ගෙවිය යුතු මුළු මුදල රු 20,477,913 ක් දක්වා වැඩි වී තිබුණු අතර එය අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ඈ) ඉදිරිපත් වූ තොරතුරු අනුව දෙපාර්තමේන්තුව වෙත රටඉඳි මෙට්‍රික් ටොන් 222 ක් ලැබී තිබුණු අතර ඉන් මෙට්‍රික් ටොන් 20 ක් පෞද්ගලික සංවිධානයක් වෙත ලබාදී තිබුණි. එම රටඉඳි තොග අදාළ පර්ශව වෙත භාර දීම හා එම ආයතන විසින් එම රටඉඳි බෙදා හැරීම සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් සෘජුව බෙදාහරින ලද රටඉඳි මෙට්‍රික් ටොන් 202 න්, කිලෝ ග්‍රෑම් 124,744 ක රටඉඳි ලද බවට අදාළ පල්ලි වෙතින් සනාථන ලබාගෙන නොතිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

## 3.7.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

-----------------------------------------------------------------

### (අ) දහම් පාසැල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදි මිලදී ගැනීම

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට දහම් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදි මිලදී ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතන දෙකකට රු.6,899,543 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මිල ගණන් කැඳවීම හා සැපයුම්කරුවන් තෝරාගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් රු.මිලියන 10 දක්වා අනුමත කර මිලදී ගැනීම් කළ හැකි වුවද ඒ සඳහා මුද්‍රා තැබූ මිලගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතුය. මෙහිදී සැපයුම්කරුවන් 8 දෙනෙකු වෙත ලිපි යැවූ බවට ලිපින ඇතුළත් සටහනක් ගොනුවට අමුණා තිබුණ ද ලිපි යැවූ බවට සනාථන වශයෙන් ලියාපදිංචි තැපැල් කුවිතාන්සි හෝ ලිපි භාරදුන් බවට සාක්ෂි නොතිබුණි. මිලගණන් විවෘත කරන අවස්ථාවේ අදාළ ආයතනයන්හි නියෝජිතයින් සහභාගි වූ බවට සාක්ෂි නොතිබුණි.

(ii) පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනයේ තාක්ෂණ නිලධාරියකුගේ සහය ලබාගෙන තිබූ අතර ඔහු විසින් ලබාදුන් නිරීක්ෂණ වාර්තාව අනුව සැපයුම්කරුවන් දෙදෙනාම ලබාදී තිබූ අබායා රෙදි හා කලිසම් රෙදි පිරිවිතරයන්ට නොගැලපෙන නිසා අනුමත නොකරන බව දන්වා තිබුණි. දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි නැවත ඇගැයීම් සිදුකර ඉදිරිපත් කරන ලද වාර්තාවේද අබායා රෙදි හා කලිසම් රෙදිවල සාම්පල පිරිවිතරයන් සමග නොගැලපෙන බව සඳහන්ව තිබුණි. එසේ වුවත් එම සැපයුම්කරුවන්ගෙන් නිල ඇඳුම් සඳහා රෙදි මිලදීගෙන තිබුණි.

(iii) අබායා රෙදි සඳහා මිල ගණන් කැඳවීමේදි මීටර් 3.5 බැගින් වූ රෙදි කැබලි 2500 ක් දක්වා තිබුණද මිලදි ගැනීම සඳහා මීටර් 3.5 බැගින් වූ රෙදි කැබලි 5080 ක් ඇනවුම් කර ලබාගෙන තිබුණි. මේ අනුව මිල ගණන් කැඳවීමේදී සඳහන් කළ ප්‍රමාණය ඉක්මවා රෙදි කැබලි 2580 ක් වැඩිපුර මිල දී ගැනීම සඳහා රු 2,829,767ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) කලිසම් හා කමිස රෙදි කැබලි සමාන ප්‍රමාණවලින් මිලදීගත යුතු වුවත් පිළිවෙලින් කැබලි 1488 හා 1333 වශයෙන් අසමාන ප්‍රමාණ මිලට ගෙන තිබුණි. එහිදි කමිස රෙදි කැබලි වලට වඩා කලිසම් රෙදි කැබලි 140 ක් වැඩිපුර මිලට ගැනීමට හේතුව පැහැදිලි කර නොතිබුණි.

(v) නිල ඇඳුම් රෙදි සඳහා ලැබීම් රිසිට්පතක් නිකුත් කර නොතිබුණි. ගෙවීම් වවුචරයේ පිටුපස මුද්‍රවක් මත ගබඩා ලෙජරයේ පිටපත් කළ බවට සඳහන් කර තිබුණ ද එකී දිනය ගබඩා ලෙජරයේ දක්වා ඇති දිනයන් හා නොගැලපෙන බව නිරීක්ෂණය විය.

(vi) 2017 ජූලි 12 දින සිදු කළ පරීක්ෂාවේ දී අබායා රෙදි කැබලි 44 ක හා කමිස රෙදි කැබලි 5 ක අතිරික්තයක්ද කලිසම් රෙදි 9 ක හිඟයක්ද පැවතුණි.

**(ආ) අහදියා දහම්පාසල් පොත් මුද්‍රණය**

---

මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අහදියා දහම් පාසැල් සඳහා ලබා දෙනු ලබන 10, 11 හා 12 ශ්‍රේණිවල පෙළපොත් සිංහල හා ඉංග්‍රිසි මාධ්‍යයට පරිවර්තනය කිරීම හා 6 සිට 9 දක්වා වූ ශ්‍රේණි සඳහා පෙළ පොත් දෙමළ මාධ්‍යයෙන් සංස්කරණය කර මුද්‍රණය කිරීම සඳහා කටයුතු ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය කරන ලද අහදියා දහම් පාසැල්වල 10, 11 හා 12 ශ්‍රේණි පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ මුළු ඇස්තමේන්තුව රු.4,264,200 ක් වූ අතර එම සම්පූර්ණ මුදලම, 2015 හා 2016 වර්ෂ තුළ දී ප්‍රතිපාදන මාරුකිරීම මඟින් ගෙවා තිබුණි. කෙසේ වුව ද මුද්‍රිත පොත් 2017 ජූලි 31 දින වන විටත් නොලැබීම හේතුවෙන් මුදල් වැය කිරීමේ අරමුණු සඵල වී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේදි 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා වූ දහම් පාසැල් සිසුන් සඳහා පෙළපොත් 8 ක් සංස්කරණය කර මුද්‍රණය කිරීමට කටයුතු ආරම්භ කර තිබූ අතර ඒ සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ මුළු ඇස්තමේන්තුව වූ රු. 3,493,700ක් හා සංස්කාරක මණ්ඩලය වෙත රු 2,080,000 ක මුදලක් ගෙවා තිබුණද 2017 ජූලි 31 වන විටත් පොත් මුද්‍රණය කර දෙපාර්තමේන්තුව වෙත ලබාගෙන නොතිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

---

මුස්ලිම් පල්ලි සංවර්ධනය සඳහා රු.15,800,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල, පල්ලි වලින් ලැබී තිබූ ඉල්ලීම් මත පදනම්ව බෙදා හැර තිබූ අතර, ආධාර අවශ්‍ය පල්ලි හඳුනාගෙන, එම පල්ලිවලට ආධාර මුදල් ලබාදීම සඳහා වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 95 | 56 | 39 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 27 | - | 27 |
| | එකතුව | 123 | 104 | 46 | 27 |